අයවැය චක්‍රලේඛ **02/2020 (i)**

බස්නාහිර පළාතේ සියලුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය/ පාලන/ පිරිස් හා පුහුණු/ සැලසුම්/ ඉංජිනේරු),

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය නිසා ඇති වී ඇති අහිතකර බලපෑම හේතුවෙන් පළාත් සභා වියදම් පාලනය**

භාණ්ඩාගාර ලේකම් මගින් නිකුත් කළ 2020.05.31 දිනැති අයවැය චක්‍රලේඛ 03/2020 හා මුදල් කොමිෂන් සභා ලේකම්ගේ අංක FC/RCA/Gen/6/1/2020 හා 2020.06.10 දිනැති ලිපිය හා බැඳේ. (පිටපත් අමුණා ඇත.)

02. එම ලිපි මගින් පවත්නා ව්‍යසන තත්ත්වය හේතුවෙන් රාජ්‍ය ආදායම අපගමනය වීමත් කොවිඩ් 19 ව්‍යසනය සහ කාලගුණික වෙනස්වීම් මත පැන නැගී ඇති ආපදා හේතුවෙන් දරන්නට වන වියදම් වැඩි වීමත් කරණ කොට ගෙන රාජ්‍ය මූල්‍ය අවකාශය තවදුරටත් හීන වී ඇති බැවින්, රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත.

03. ඒ අනුව වියදම් පාලනය සම්බන්ධව ම'විසින් නිකුත් කළ 2020.04.27 දිනැති පළාත් අයවැය චක්‍රලේඛ 02/2020 මගින් ඉදිරිපත් කළ උපදෙස්වලට අමතරව, ඉහත සඳහන් අයවැය චක්‍රලේඛ 03/2020 හි හා මුදල් කොමිෂන් සභා ලේකම්ගේ ලිපිය මගින් ලබා දී ඇති පහත උපදෙස් ද අනුගමනය කළ යුතු බව කරුණාවෙන් දන්වා සිටිමි.

1. මේ වන විටත් වැඩ ආරම්භ කර ඇති තවදුරටත් පවත්වාගෙන යා යුතු ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන වැඩසටහන්, ව්‍යාපෘති හා විෂයයන් සඳහා පමණක් වියදම් දැරිය යුතු අතර නව කාර්යය මණ්ඩල වියදම්, සැපයුම් හා සේවාවන් මෙන්ම නව කාර්යයන් හා ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් බැඳීම් ඇති කර නොගත යුතුය.

2. ප්‍රතිපාදන වෙන් වී නොමැති නමුත් අත්‍යවශ්‍යවන වියදමක් ඇති වුවහොත් එවැනි වියදම් ද පළාත් අයවැය චක්‍රලේඛ 02/2020 හි සීමාවන් ද අනුගමනය කරමින් ඒ ඒ කාර්යාල වෙත දැනටමත් වෙන් වී ඇති ප්‍රතිපාදන තුලින්ම කළමනාකරණය කරගැනීමට වැය දරන ආයතන විසින් අවශ්‍ය විධිවිධාන සලසාගත යුතු බව තරයේ අවධාරණය කරමි.

3. වියදම් දැරීමේ දී දැනටමත් නිමකර ඇති කාර්යයන් සඳහා ඉදිරිපත් වී ඇති බිල්පත් නිරවුල් කිරීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර 2020 මැයි 20 දිනැති අංක 20/Misc(028) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය ආයතන සඳහා නව ගොඩනැගිලි ඉදි කිරීම කල් දැමීම, පුනරාවර්තන වියදම් දැඩිව පාලනය කිරීම සඳහා විධිවිධාන යෙදීම හා ප්‍රමුඛත්වයෙන් අඩු වියදම් විලම්භනය කිරීමට සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතු ය.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත් -

01. විගණකාධිපති.
02. ලේකම්, මුදල් කොමිෂන් සභාව.
03. සභාපතිවරු, ව්‍යවස්ථාපිත අධිකාරි - තම අධිකාරිවල මූල්‍ය පාලනය ඇති කිරීම සඳහා
04. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)